සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - සමාජ ආරක්ෂණ අංශය
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக பாதுகாப்பு அமைச்சு - சமூகபாதுகாப்பு பிரிவு
Ministry of Women, Child Affairs and Social Security - Social Security Division

මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/01/චක්‍රලේඛ
ඔබේ අංකය / உமது இல / Your No: ....................
දිනය / திகதி / Date: 2020.06.16

සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක :-2020/07ට පළමු එකතුව

සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු/ බැංකු සමිති කළමනාකරුවන් සහ

සමෘද්ධි බැංකු සමිති විධායක කමිටු/ සමෘද්ධි බැංකු පාලක මණ්ඩල සභාපතිවරුන් වෙත,

**Covid-19 වෛරස වසංගත තත්ත්වය මත බලපෑමට ලක් වූ සමෘද්ධි බැංකු / බැංකු සමිති සාමාජිකයින්ට ණය මුදල් ගෙවීමට සහන සැලසීම**

Covid-19 වෛරස වසංගත තත්ත්වය මත ඇති වූ මූල්‍ය දුෂ්කරතා හේතුවෙන් සමෘද්ධි බැංකු / බැංකු සමිති හරහා ලබා ගත් ණය මුදල් ආපසු ගෙවීමට සහන සැලසීම උදෙසා සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක 2020/07 මඟින් උපදෙස් ලබා දී ඇත. එම උපදෙස් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මඟපෙන්වීමට හා නව උපදෙස් ලබාදීමට මෙම එකතුව නිකුත් කරනු ලබයි.

**02.** මුල් චක්‍රලේඛයෙහි ඡේද අංක 04හි සඳහන් උපදෙස් අනුව කටයුතු කිරීමේ දී පහත උපදෙස් අනුව කටයුතු කළ යුතුය.

**2. 1.** සමෘද්ධ බැංකු / බැංකු සමිති වල ක්‍රියාත්මක සියළුම ණය වැඩසටහන් (ස්වශක්ති පාරිභෝගික ආපදා, නිවාස ඇතුළු) සඳහා මෙම සහනය හිමි වේ.

**2.2.** 2020.03.15 දිනට පෙර ණය මුදලක් ලබාගෙන දැනට පිටහිටි ණයකරුවන්ට ඔවුන්ගේ අභිමතය මත ලිඛිතව කරනු ලබන ඉල්ලීම් සඳහා පොලී සහනය හා ණය ගෙවීමට ඉදිරි මාස 06ක උපරිම කාලයක් ලබාදීම සිදු කරනු ලබයි.

**2.3.** ඉල්ලා සිටින සහන කාලය සඳහා වාර්ෂිකව පොලී අනුපාතයට 4%කි. එහි දී දින ගණන අනුව පොලිය ගණනය කරනු ලබයි. එම පොලී මුදල 2020.09.15 වන දින සිට හෝ එකඟ වූ කාලයට පසුව ඉදිරි කාලය තුල කොටස් වශයෙන් ගෙවීමට ද ඉඩ දෙනු ලැබේ.

***නිදසුන :-*** යම් සාමාජිකයෙකු විසින් ලබා ගත් ණය මුදලක් 2020.03.12වන දිනට (අදාල මාසයේ වාරිකය ගෙවූ දිනට පසු ) ශේෂය රුපියල් 6,500/- කි. සහන වැඩසටහන යටතේ ණය සහනය ඉල්ලා ඇත. ඒ අනුව 2020.09.15 වන දින දක්වා දින 187ක් සඳහා අයවිය යුතු පොලී මුදල රුපියල් 133/- ක් වේ.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | wajira | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

**2.4.** 2020.09.15 දින හෝ ඉල්ලා සිටින කාලය අවසන් වූ පසු, පළමු මාසික ණය වාරිකය (ඡේද අංක 2.3 අනුව සැකසූ පොලිය සමඟ) ගෙවිය යුතුය. එහිදී යම් ණයකරුවෙකු සහන කාලය නිමවන දිනට පසු දිනක ණය මුදල ගෙවීමට පැමිණෙන විටක එම කාලයට (සහන කාලය අවසන් දිනය සහ ණය වාරිකය ගෙවන දිනය දක්වා අතර කාලය) පමණක් ගිවිසුම්ගත පොලි අනුපාතයට පොලිය ගණනය කළ යුතුය. ඉන් අනතුරුව එළැඹෙන ණය වාරික ගෙවීමේ දී පිටහිටි ණය මුදලට ගිවිසුම් ගත පොලී අනුපාතය අනුව පොලිය ගණනය කළ යුතුය.

**2.5.** මෙම උපදෙස් ලැබීමට පෙර ණය මුදල් මාසිකව ගෙවූ/ ගෙවන ණයකරුවන්ට ද , ඔවුන්ගේ ලිඛිත ඉල්ලීම ලබා ගෙන පාලක මණ්ඩල / විධායක කමිටු අනුමැතිය මත වාර්ෂිකව 4% සහන පොලී අනුපාතය සහිතව සහන ලබාදිය යුතුය. ඒ අනුව පොලිය සඳහා ගැලපීම් ද කරගත යුතුය.


**03.** ජීවනෝපාය චක්‍රිය ණය වැඩසටහන යටතේ ලබා දුන් ණය මුදල් සඳහා ද 4% වාර්ෂික පොලී අනුපාතයක් සහන කාලය තුල අය කරනු ලබයි. සහන කාලය තුල අය වන පොලී ආදායම සමසමව බෙදා ගිණුම් ගත කළ යුතුය.

**04.** සහන වැඩසටහන පිළිබඳ ණයකරුවන් දැනුවත් කිරීම ක්ෂේත්‍රගත සමෘද්ධි සංවර්ධන නිලධාරීන් ඇතුළු පාලක මණ්ඩල/ විධායක කමිටු සාමාජිකයන්, ප්‍රජාමූල සංවිධාන නිලධාරීන් හරහා සිදු කල යුතු ය. එහි දී රැස්වීම් සහ දැන්වීම් ප්‍රදර්ශය මගින් දැනුවත් කළ යුතුය. ඒ අනුව සහනය ඉල්ලා සිටින ණයකරුවන්ට පමණක් මෙම උපදෙස් අනුව සහනය සැලසිය යුතු බැවින් මේ පිළිබඳ වගකීම ඔබ වෙත පවරමි.

**05.** දී ඇති ණය මෙහෙයුම් උපදෙස් පරිදි ණය තොරතුරු රෙජිස්තරය නඩත්තු කිරිමේදී සහන ලැබෙන ණය මුදල් ද අදාල දිනවල අයකර ගත යුතු තිරුවේ සටහන් කිරිමටත්, මුදලින් ණය ලැබෙන දිනකදී අයකර ගත් තීරුවේ සටහන් කිරීම ද කළ යුතුය. එසේ නොකලහොත් ණය වාර්තාව සකස් කිරිමේදී ගැටලු ඇති වන බව දන්වමි.

**06.** අනෙකුත් කරුණු සම්බන්ධව මුල් චක්‍රලේඛ උපදෙස් තවදුරටත් වලංගු කරගත යුතුය.

**07.** Covid-19 වෛරස වසංගත තත්ත්වය තුල ඔබ සැම එක්ව මෙම කටයුතු සාර්ථක කර ගැනීමට දක්වන ලද සහාය පිළිබඳ ස්තුතිවන්ත වෙමි.



ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

01. ලේකම් , කාන්තා,ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - කා.දැ.ස
02. ලේකම් , සමාජ ආරක්ෂණ අංශය - කා.දැ.ස
03. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් /දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ ජනරාල්වරුන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස හා අ.ක.ස.
04. ප්‍රධාන අභ්‍යන්තර විගනක - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
05. අධ්‍යක්ෂ- ක්ෂුද්‍රමූල්‍ය සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
06. සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.ස හා අ.ක.ස.
07. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් ,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කා.දැ.ස. හා අ.ක.ස.
08. සියළුම අංශ ප්‍රධානීන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
09. සියළුම දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අ.ක.ස.